**පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 395**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නවවැනි වාර්තාව

(2025.09.12 වැනි දින භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර
මහතා විසින්
2025 දෙසැම්බර් මස 18 වැනි දින ඉදිරිපත් කරන ලදී

*2025 දෙසැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී*

## <u>දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය</u>
## <u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සංයුතිය</u>

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු අර්කම් ඉල්යාස් මහතා,පා.ම., ( 2025.05.08 දින සිට)
3. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම., *(2025.03.21 දින සිට.)*
4. ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම., *(2025.05.20 දින සිට)*
5. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
6. ගරු ඩී.වී. චානක මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*
7. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
8. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*
9. ගරු. එස්.එම් මරික්කාර් මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
10. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම., *(2025.05.20 දින සිට)*
11. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
12. ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම., *( 2025.05.08 දින සිට)*
13. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
14. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම., *(2025.03.21 දින සිට)*
15. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
16. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
17. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම., *(2025.05.08 දින සිට)*
18. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
19. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
20. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
21. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
22. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
23. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
24. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
25. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
26. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
27. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
28. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,

29. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
30. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,
31. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*

**<u>කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය</u>**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- ❖ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) -හිමාලි සමරදිවාකර මෙය
- ❖ ප්‍රධාන නිලධාරි - එච්. රූපානි ද සොයිසා මිය
- ❖ නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - එස්. එල්. වික්‍රම මයා
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - අයි. එස්. ගෝමස් මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය

**<u>කාරක සභා වාර්තා</u>**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

www.parliament.lk

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

**පටුන**


| | | පිටු අංක |
|---|---|---|
| 1. | සභාපතිතුමාගේ සටහන | V |
| 2. | විධායක සාරාංශය | VI |
| 3. | දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නවවැනි වාර්තාව | VII |
| 4. | මූලාා ප්‍රකාශන පිළිබඳ විගණන මතය | 1 |
| 5. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් විමර්ශනය කරන ලද ආයතනය- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 2-20 |

## සභාපතිතුමාගේ සටහන

පාර්ලිමේන්තුවේ විශේෂ කාර්යයන් සඳහා වන කාරක සභා යටතේ ස්ථාපිත, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2025.09.12 දින පරීක්ෂාවට ලක් කළ පරිසර අමාත්‍යාංශය යටතේ පැවති මේ වන විට කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයට අයත් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2023 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සහ එහි වර්තමාන කාර්ය සාධනයට අදාළව සිදු කළ විමර්ශනයේ වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

2009 අංක 66 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත ප්‍රකාරව පිහිටුවා ඇති භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ දැක්ම, මෙහෙවර හා කර්තව්‍ය පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

ඛනිජ ගවේෂණ බලපත්‍ර සතු බාහිර පාර්ශවයන් විසින් ඛනිජ ගවේෂණ මගින් ලබා ගන්නා දත්ත, ආයතනය සතු කර ගත හැකි පරිදි නෛතික විධිවිධාන ශක්තිමත් කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සඳහා බලපවත්වන 1992 අංක 03 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත සංශෝධනය කිරීම හා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු බවත් කාර්යාංශය සඳහා ඛනිජ ප්‍රතිපත්තියක් සකස් කිරීමට කටයුතු කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවයත් කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී. ප්‍රාදේශීය කාර්යාල විසින් නිකුත් කරන බලපත්‍ර හා ඒ සම්බන්ධයෙන් බලපවත්වන නිර්ණායක සම්බන්ධයෙන් කාරක සභාව අවධානය යොමු කළ අතර, ප්‍රාදේශීය කාර්යාල ව්‍යුහය පිළිබඳව අධීක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමේ වැදගත්කම පෙන්වා දෙන ලදී.

තිරුවානා හා මිනිරන් අපනයනය කිරීම සම්බන්ධයෙන් වැදගත් සාකච්ඡාවක් මෙහිදී සිදුවූ අතර පළිඟු අපනයනය නියාමනය කිරීම, පළිඟු අපනයනය මෙන්ම තිරුවානා අපනයනය ධෛර්යමත් කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් සකස් කිරීම හා තිරුවානා අපනයනය මගින් රටට ආදායමක් ලැබෙන බව තහවුරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමේ වැදගත්කම මෙහිදී පෙන්වා දෙන ලදී.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විමර්ශනයන් මගින් ඵලදායී ප්‍රතිඵල ලබාගැනීමට නම් මෙම කමිටුවේ නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා වගකීම හා වගවීම ස්ථාපිත කිරීම අතිශයින් වැදගත් වේ. මෙම කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සාමාජික මන්ත්‍රීවරුන්ගේ ද සහායෙන් ලබාදෙන නිර්දේශයන් ක්‍රියාත්මක කරවීමට උපරිම උත්සාහ ගන්නා බව දන්වනු කැමැත්තෙමි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා, එම කාරක සභාවේ සාමාජික ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබෙන සහායත්, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයෙන් සහ උපදේශකවරු දෙදෙනාගෙන් ලැබෙන සහායත්, භාණ්ඩාගාර නිලධාරීන්ගෙන් සහ වැඩබලන විගණකාධිපතිතුමා ප්‍රධාන ජාතික විගණන කාර්යාලයෙන් ලැබෙන සහායත් අගය කොට සලකමි.

වෛද්‍ය නිශාන්ත සමරවීර
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

<u>විධායක සාරාංශය</u>

2025.09.12 වැනි දින පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2022 හා 2023 වර්ෂයන්හි විගණකාධිපති වාර්තා හා එහි වත්මන් කාර්යසාධනය පිළිබඳව කරුණු පරීක්ෂා කරන ලදී.

2009 අංක 66 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මගින් පිහිටුවා ඇති භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ දැක්ම, මෙහෙවර හා කර්තව්‍ය පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු වූ අතර කැණීම් බලපත්‍ර නිකුත් කිරීම, ඛනිජ ගවේෂණය මගින් ලබාගන්නා සංවේදී දත්ත ආයතනය සතු කර ගැනීමේ ක්‍රමවේදයක් නොමැතිවීම සම්බන්ධයෙන් මෙහිදී අවධානය යොමු කෙරිණි.

කාර්මික කැණීම් හා ශිල්පීය කැණීම් බලපත්‍ර සම්බන්ධයෙන් හා මන්නාරම් දූපතේ ඛනිජ වැලි ගවේෂණය සඳහා ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ සමාගම් 5ක් වෙත ගවේෂණ බලපත්‍ර 09 ක් නිකුත් කර තිබීමත් එකී සමාගම්වලට වසර 10-13 දක්වා කාලයක සිට කාල දීර්ඝයන් සහිතව ගවේෂණ බලපත්‍ර නිකුත් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය දක්වා ඛනිජ වැලි ප්‍රදේශ සොයා ගෙන නොතිබීම සම්බන්ධවත්, මෙහිදී සිදුවී ඇති අක්‍රමිකතා හේතුවෙන් ආයෝජකයන්ට අවස්ථා සීමිත වී තිබීම යනාදී කරුණු පිළිබඳවත් වැදගත් කරුණු මෙම වාර්තාවේ අඩංගු වී ඇත.

කාර්යාංශයේ කටයුතු නිවැරදි මාර්ගයට යොමු කිරීමට අදාළව කමිටුවක් පත් කර තිබූ අතර එහි භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ (GSMB) පනත් සංශෝධනයට අදාළ කරුණු ද ඇතුළත්ව ඉතා වැදගත් යෝජනා එම කමිටු වාර්තාවේ අඩංගු වී ඇත.

තිරුවානා හා මිනිරන් අපනයනය සම්බන්ධයෙන් මෙන්ම ආයතනයේ උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය සම්බන්ධයෙන් ලබාදුන් නිර්දේශ මෙම වාර්තාවේ අඩංගු කර ඇත.

## දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය
## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නවවැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ නවවැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

සියලු රාජ්‍ය සංස්ථා ද යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම් සහ වර්තමාන කාර්යසාධනය, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යය වේ.

වර්තමානයේ දී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතට ගැනෙන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා අය වැය දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වනු ලබන පොදු ව්‍යාපාර 462 ක් පවතී. (මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව)

| අනු අංකය | කැඳවූ ආයතනය | කාරක සභාව පැවැත් වූ දිනය |
|---|---|---|
| 1. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.18 |
| 2. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.20 |
| 3. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.02.27 |
| 4. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.05 |
| 5. | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 2025.03.12 |
| 6. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.27 |
| 7. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 2025.04.02 |

| | | |
|---|---|---|
| 8. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.05.08 |
| 9. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 2025.05.09 |
| 10. | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 2025.05.15 |
| 11. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.05.23 |
| 12. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 2025.06.04 |
| 13. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 2025.06.20 |
| 14. | මහපොළ භාරකාර අරමුදල | 2025.07.09 |
| 15. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.07.17 |
| 16. | රාජ්‍ය දැව සංස්ථාව | 2025.07.23 |
| 17. | සිවිල් ගුවන් සේවා අධිකාරිය | 2025.08.20 |
| 18. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 2025.09.10 |
| 19. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 2025.09.12 |
| 20. | ලංකා විදුලිබල මණ්ඩලය | 2025.09.24 |
| 21. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 2025.10.08 |
| 22. | ලංකා සතොස ලිමිටඩ් | 2025.10.10 |
| 23. | ලංකා විදුලිබල මණ්ඩලයේ පරීක්ෂණයට අදාළව එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම හා එහි පරිපාලිත සමාගම් | 2025.10.24 |
| 24. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.19 |

ඒ අතරින්, 2025.09.12 වැනි දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පරිසර අමාත්‍යාංශයේ විෂය පථයට අයත්ව තිබූ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2023 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සහ වර්තමාන කාර්යසාධනය පරීක්ෂාවට ලක් කොට කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

## <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය</u>

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2022 හා 2023 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

| <u>ආයතනය</u> | <u>වර්ෂය</u> | |
|---|---|---|
| | **2022** | **<u>2023</u>** |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණය කළ මතය |

<u>විගණන මත වර්ග</u>

**01.** <u>තත්ත්වාගණනය නොකළ මතය</u> **(Unqualified Opinion)**

මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

**02.** <u>තත්ත්වාගණනය කළ මතය</u> **(Qualified Opinion)**

වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

**03.** <u>මතය ව්‍යාවනය කිරීම</u> **(Disclaimer of Opinion)**

ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

04. <u>අහිතකර මතය (Adverse Opinion)</u>

ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය**
***(පරිසර අමාත්‍යාංශය)***

***2025.10. 18 දින සිට මෙම ආයතනය කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගෙන ඇත.***

**විමර්ශනය කරන ලද දිනය -2025.09.12**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

**01. කාර්යාංශය පිහිටුවීම**

2009 අංක 66 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත ප්‍රකාරව මෙම ආයතනය පිහිටුවා ඇත.

**02. දැක්ම**

සමාජ සංස්කෘතික සහ පාරිසරික සාරධර්ම සුරකින අතරම ජනතාවගේ ජීවන ප්‍රමිතීන් සහ ජීවනෝපායන් වැඩි දියුණු කිරීම සඳහා පෘථිවිය සහ එහි ශක්තිය පිළිබඳව අවබෝධ කර ගනිමින් සහ එය කළමනාකරණය කරමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය ලබා දීම.

**03. මෙහෙවර**

ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් කළමනාකරණය හා සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා සහ රටෙහි යහපත සඳහා ඛනිජ සතු ශක්තිය අවබෝධ කරගනු ලබන බව සහ කාර්යක්ෂම, ආරක්ෂිත සහ පාරිසරික වශයෙන් සවිමත් ආකාරයකින් ඛනිජ නිස්සාරණය කරගනු ලබන බව තහවුරු කිරීම.

**04. <u>කර්තව්‍ය</u>**

පනතේ 12 වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ කර්තව්‍යයන් පහත පරිදි වේ.

(අ) ශ්‍රී ලංකාවෙහි ක්‍රමවත් භූ විද්‍යා සිතියම් සැකසීම භාර ගැනීම සහ භූ විද්‍යා සිතියම් සකස් කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් හඳුනා ගැනීම සහ ඒවා තක්සේරු කිරීම ;

(ඇ) ඒ ඛනිජ සඳහා පතල් කැනීමේ වාණිජමය ස්වශක්තිතාව පිළිබඳව ඇගයීම සහ ඛනිජ සකස් කිරීම හා අපනයනය කිරීම ;

(ඈ) ඒ ඛනිජ සඳහා ගවේෂණ කිරීම හා පතල් කැනීම සහ ඒ ඛනිජ සකස් කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම, වෙළෙඳාම හා අපනයනය කිරීම, බලපත්‍ර නිකුත් කිරීම මගින් විධිමත් කිරීම ;

(ඉ) ඛනිජ ද්‍රව්‍ය පදනම් වූ නිෂ්පාදන සංවර්ධනය කිරීම මගින් ඒවා ප්‍රවර්ධනය කිරීම, නිශ්කර්ෂණය කිරීම, වටිනාකම එකතු කිරීම සඳහා සහ වාණිජමය පදනමක් මත එකී ඛනිජ ද්‍රව්‍ය පදනම් වූ නිෂ්පාදන අපනයනය සඳහා උපයෝගී කරගත යුතු පියවර පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ඊ) පනතේ විශේෂයෙන්ම මේ වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද යටතේ වූ කර්තව්‍ය ඉටු කිරීමේදී ලබාගත් තොරතුරු සහ දත්ත උචිත මාධ්‍ය මගින් පතල කිරීම ; සහ

(උ) ඉංජිනේරු භූ විද්‍යාව හා සම්බන්ධ ව්‍යාපෘති භාර ගැනීම සහ භූ විද්‍යාත්මක ආපදා සහ ව්‍යසන සම්බන්ධයෙන් ප්‍රතිකර්ම වශයෙන් ගත යුතු පියවර පිළිබඳව උපදෙස් ලබාදීම.

## 05. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කරන ලද ගවේෂණ බලපත්‍ර සංඛ්‍යාව

ගවේෂණය සඳහා බලපත්‍ර නිකුත් කිරීම කාර්යාංශයේ ප්‍රධානම කාර්යය වේ. 2022 වර්ෂයේ සිට 2025 අගෝස්තු 22 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා කාර්යාංශය විසින් නිකුත් කර ඇති මුළු ගවේෂණ බලපත්‍ර සංඛ්‍යාව 67 ක් වූ අතර 2024 වර්ෂයේ දී ගවේෂණ බලපත්‍ර 36ක්, 2023 වර්ෂයේ දී 18 ක් හා 2022 වර්ෂයේ දී 13 ක් වශයෙන් ගවේෂණ බලපත්‍ර නිකුත් කර තිබුණු අතර 2025 වර්ෂයේ දී ගවේෂණ බලපත්‍ර කිසිවක් නිකුත් කර නොතිබිණි.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය තම ක්‍රමවේද අනුව ඛනිජ ගවේෂණය සඳහා ගවේෂණ බලපත්‍ර නිකුත් කිරීමත් ඛනිජයක් ඇති බවට සොයා ගත් පසු අදාළ දත්ත හා තොරතුරු, කාර්යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය. කැණීම් බලපත්‍රය නිකුත් කිරීමට පෙර පාරිසරික ඇගයීම් වාර්තාවක් ලබාගත යුතු අතර කැණීම ඵලදායී නම් පමණක් කැණීම් බලපත්‍රය නිකුත් කරනු ලැබේ.

වර්ෂ 2022 සිට 2025 දක්වා භූ විද්‍යා සිතියම් ගත කිරීම් 13ක් සිදුකර තිබුණි. සිතියම් මෘදු පිටපත් ආකාරයෙන් නිකුත් කිරීම, කාර්යාංශය විසින් සිදු කරනු ලබන අතර අවශ්‍ය අයට ඒවායේ දෘඩ පිටපත් මිලදී ගැනීමේ හැකියාව කාර්යාංශය විසින් සලසා ඇත.

නිකුත් කරන ලද ගවේෂණ බලපත්‍ර අතුරින් මේ වන විට සක්‍රීය තත්ත්වයේ බලපත්‍ර 40 ක් පමණ පවතින අතර ගවේෂණ බලපත්‍රයක වලංගු කාල සීමාව වසර 5 කි. ගවේෂණය කරන ඛනිජය අනුව බලපත්‍රයේ වලංගු කාල සීමාව ඊට වඩා කෙටි කිරීමද කරනු ලැබේ.

කාර්යාංශය ස්ථාපිත කළ දින සිට ගවේෂණ බලපත්‍ර 471ක් නිකුත් කර තිබුණි. ඒවායින් බලපත්‍ර 43ක් පමණ සක්‍රීය තත්ත්වයේ තිබූ අතර කැණීම් සඳහා යොමු වී තිබුණේ සුළු ප්‍රමාණයක් පමණි.

<u>නිර්දේශය</u>

i. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ස්ථාපිත කළ දින (1993) සිට මේ දක්වා නිකුත් කරන ලද ගවේෂණ බලපත්‍ර සංඛ්‍යාව, බලපත්‍ර නිකුත් කරන ලද සමාගම්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට එමගින් ලද ආදායම හා ගවේෂණ බලපත්‍ර නිකුත් කළ ඛනිජ වර්ග පිළිබඳව වාර්තාවක් කාරක සභාවට සහ විගණකාධිපතිට ඉදිරිපත් කිරීම.

## 06. <u>ඛනිජ ගවේෂණය මගින් අනාවරණය කරගනු ලබන දත්ත</u>

ගවේෂණ බලපත්‍රයක් යටතේ කරනු ලබන ගවේෂණයක් මගින් ආයතන ලබා ගන්නා සංවේදී දත්ත කාර්යාංශය සතු කර ගැනීම සම්බන්ධයෙන් වන ක්‍රියාවලියේදී ගවේෂණය අවසානයේ කාර්යාංශයේ දී සිදුකරන ඉදිරිපත් කිරීම (Presentation) හරහා දත්ත ලබා ගැනීම ආයතනය විසින් කරනු ලබයි. එම දත්ත අඛණ්ඩව සිදු කරනු ලබන නියාමනයක් හරහා හා කාර්යාංශය විසින් කරනු ලබන භූමි පරීක්ෂාවක් හරහා ලබා ගන්නා දත්ත නොවේ. බලපත්‍රලාභී ආයතන විසින් සපයන දත්ත මත පදනම්ව සිදුකරන ඉදිරිපත් කිරීමය.

ආයෝජකයන් ආකර්ශණය කර ගැනීම සඳහා ලබාගෙන ඇති ගවේෂණ බලපත්‍ර වැඩි මිලකට බාහිර පාර්ශවයන්ට විකිණීම වර්තමානයේ සිදුවන බව නිරීක්ෂණය වන අතර ඒ මගින් රජයට ලැබිය යුතු ආදායම අහිමි කරමින් වංචනික ක්‍රියා සිදුවීම ද මෙම ක්ෂේත්‍රය තුළ සිදුවේ.

එසේම, ගවේෂණය මගින් අනාවරණය කර ගන්නා නිවැරදි දත්ත කාර්යාංශය වෙත ලැබීම තහවුරු කිරීමේ සුදුසු යාන්ත්‍රණයක් කාර්යාංශය මගින් ගොඩනගා නොමැත.

<u>නිර්දේශ</u>

i. ඛනිජ ගවේෂණය මගින් බලපත්‍ර සතු බාහිර පාර්ශවයන් විසින් ලබා ගන්නා දත්ත, කාර්යාංශය සතු කර ගත හැකි පරිදි නෛතික විධිවිධාන ශක්තිමත් කිරීම සඳහා 1992 අංක 03 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත සංශෝධනය කිරීම හා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

ii. කාර්යාංශය සඳහා ඛනිජ ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

**07. <u>කාර්මික කැණීම් හා ශිල්පීය කැණීම් බලපත්‍ර</u>**

ශිල්පීය කැණීම් බලපත්‍ර ලබාගැනීම සඳහා ගවේෂණයක් සිදු කිරීම අවශ්‍ය නොවන අතර ආයතනයේ රෙගුලාසි අනුව ගවේෂණ බලපත්‍රයක් අවශ්‍ය වන්නේ කාර්මික කැණීම් සඳහාය.

**08. <u>මන්නාරම් දූපතේ ඛනිජ වැලි ගවේෂණය</u>**

මන්නාරම් දූපතේ ඛනිජ වැලි ගවේෂණය සඳහා ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ සමාගම් 5ක් වෙත ගවේෂණ බලපත්‍ර 09 ක් නිකුත් කර තිබුණි. මෙකී සමාගම් වලට වසර 10-13 දක්වා කාලයක සිට කාල දීර්ඝයන් සහිතව ගවේෂණ බලපත්‍ර නිකුත් කර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වා ඛනිජ වැලි ප්‍රදේශ සොයා ගෙන නොතිබුණ බවත් ගවේෂණ බලපත්‍ර ලබාගන්නා බලපත්‍රලාභීන් කිසිදු ඛනිජ ගවේෂණයක් සිදු නොකර අදාළ ප්‍රදේශය වෙන් කර ගෙන සිටින බැවින් ඛනිජ

ගවේෂණ ව්‍යාපෘතිවල යෙදීමට අපේක්ෂාවෙන් සිටින අනෙකුත් දේශීය හා විදේශීය ආයෝජකයන්ට අවස්ථා සීමිත වී තිබුණි.

එමෙන්ම, එලෙස බලපත්‍ර ලබාගෙන තිබෙන ආයතන 5ම ඕස්ට්‍රේලියානු මව් සමාගමක පරිපාලිත සමාගම්ය.

මෙම ගවේෂණ බලපත්‍ර 9ට අදාළව එක් එක් සමාගම සඳහා නිකුත් කර ඇති ගවේෂණ බලපත්‍ර සම්බන්ධව තොරතුරු ඇතුළත් වාර්තාවක්, විගණකාධිපතිට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ නිලධාරී එකඟ වන ලදී.

**<u>නිරීක්ෂණ</u>**

කාර්යාංශයට ගවේෂණ බලපත්‍ර නියාමනය කිරීමේ ගැටලු පවතින බවත්, ගවේෂණය මගින් ලබා ගන්නා සංවේදී දත්ත එකතු කර ගැනීමේ ක්‍රමවේදයක් මෙන්ම ලැබෙන දත්තවල නිරවද්‍යතාව හා ආරක්ෂාව තහවුරු කිරීමට ක්‍රමවේදයක් ද කාර්යාංශය තුළ නොමැති බවත් නිරීක්ෂණය විය.

## 09. <u>ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් සමාගම වෙත නිකුත් කරන ලද ඛනිජ ගවේෂණ බලපත්‍රය</u>

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් සමාගම වෙත ඛනිජ ගවේෂණය සඳහා නිකුත් කර තිබූ අංක EL/406 දරන ගවේෂණ බලපත්‍රයේ වලංගු කාලය 2022 දෙසැම්බර් 30 දිනෙන් අවසන්ව තිබුණි. 2023 ජනවාරි 04 දිනැති අංක 2313/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 14(ඉ) වගන්තිය මගින් බලපත්‍රලාභීන් ගවේෂණය අවසන් කළ දින සිට හෝ බලපත්‍ර වලංගු කාලය ඉකුත් වූ දින සිට වසර දෙකක කාලයක් තුළ කැණීම් බලපත්‍රයක් ඉල්ලුම් කිරීමට හෝ අදාළ ගාස්තු ගෙවා විභව ප්‍රදේශය තමා වෙත රඳවා ගැනීම සඳහා අවස්ථාව ලබාදී තිබුණි. අදාළ ගවේෂණ ප්‍රදේශය

තවදුරටත් තහවුරු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා එම සමාගම වෙත සති 2 ක කාලයක් ලබාදී තිබුණි. එසේ තිබියදී ගවේෂණ බලපත්‍රයෙහි ඇතුළත් ග්‍රිඩ් 07 ක භූමි ප්‍රදේශයක් 2023 ඔක්තෝබර් 09 දින සිට 2025 ඔක්තෝබර් 08 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ගවේෂණ කටයුතු කිරීමට වෙනත් පුද්ගලික සමාගමක් වෙත අංක EL/434 දරන ගවේෂණ බලපත්‍රය නිකුත් කර තිබුණි.

එමෙන්ම, වසර 10 ක කාලය සම්පූර්ණ වී ඇති බැවින් කැණීම් බලපත්‍රය සඳහා අයදුම් කරන ලෙස ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් වෙත දැනුම් දී තිබුණි. 2012 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් වෙත අගය එකතු කර අපනයනය කරන ලෙස තීරණයක් ලබා දී ඇති නමුත් ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් විසින් අගය එකතු කිරීමකින් තොරව අපනයන කටයුතු සිදු කර තිබුණි.

ඒ අනුව ඛනිජ වැලි සම්බන්ධයෙන් 2012 හා 2023 යන වර්ෂයන්හි දී අමාත්‍ය මණ්ඩල තීරණ මගින් ලබා දී තිබූ නිර්දේශවලට පටහැනිව ලංකා මිනරල් සැන්ඩ් ලිමිටඩ් සමාගම ක්‍රියා කර තිබුණි.

කාර්යාංශයට අදාළ පනත තුළ, ගවේෂණය මගින් ලබා ගන්නා සංවේදී දත්ත ආයතනය සතු කර ගැනීමේ ක්‍රමවේදයක් නොමැත. එසේම, පනත මගින් බලාපොරොත්තුවන අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන නොතිබිණි. මෙම ක්‍රමවේදය නිවැරදි කර ගැනීම සඳහා අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉක්මන් ක්‍රියාමාර්ග ගත යුතුව පැවතුනි.

නමුත්, කාර්යාංශයේ කටයුතු නිවැරදි මාර්ගයට යොමු කිරීමට අදාළව මාර්තු මාසයේ දී කමිටුවක් පත් කර තිබුණි. එහි සභාපතීත්වය හූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සභාපතිවරයා විසින් දැරූ බවත්, GSMB පනත් සංශෝධනයට අදාළ කරුණු ද ඇතුළත්ව ඉතා වැදගත් යෝජනා මෙම කමිටු

වාර්තාවේ අඩංගුව තිබුණු බවත්, අදාළ කමිටු වාර්තාව, කාරක සභාවට ඉදිරිපත් කරන බවත් අමාත්‍යාංශයේ ලේකම්වරයා දැනුම් දෙන ලදී.

## 10. <u>ඛනිජ ද්‍රව්‍ය ප්‍රතිපත්තිය</u>

කෙටුම්පත් කරන ලද ඛනිජ ද්‍රව්‍ය ප්‍රතිපත්තිය 2023.07.27 දින අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර තිබුණි. එම කාලසීමාව තුළදීම ජනාධිපති ලේකම් කාර්යාලයේ හිටපු උපදේශකවරයෙකුගේ මැදිහත්වීමෙන් සකස් කරන ලද ඛනිජ ද්‍රව්‍ය ප්‍රතිපත්තියක් ද 2023.07.26 දින අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර තිබුණි. එම වාර්තා දෙක අතර නොගැලපීම් තිබේදැයි අධ්‍යයනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් නැවත කමිටුවක් පත් කර තිබුණි.

එමෙන්ම, 2024.01.08 වැනි දින මෙම කමිටු වාර්තා දෙක අතර ගැටීමක් නොමැති බවට අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබී තිබූ අතර වත්මන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය හා ගැලපෙන පරිදි මෙම ඛනිජ ප්‍රතිපත්තිය සකස් කිරීමට ද කාර්යාංශය බලාපොරොත්තු වී තිබුණි.

රාජ්‍ය පාලන තන්ත්‍රය වෙනස්වීම සමග ප්‍රතිපත්ති වෙනස් කිරීමට වඩා තිරසාර ප්‍රතිපත්තියක් සකස් කිරීමට කටයුතු කළ යුතු බවට කාරක සභාව අවධාරණය කළාය.

<u>නිර්දේශ</u>

i. තිරසාර ජාතික ඛනිජ ද්‍රව්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම

## 11. <u>ආයතන ව්‍යුහය</u>

ජනතාවගේ පහසුව වෙනුවෙන් සමස්ත රටම ආවරණය වන පරිදි ප්‍රාදේශීය කාර්යාල 21ක් පිහිටුවා ඇති අතර ප්‍රාදේශීය කාර්යාලවලට අමතරව

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ද බලපත්‍ර නිකුත් කරන බවත්, ඒ සඳහා බලපවත්වන නිර්ණායක ඇති බවත් කාරක සභාවේදී අනාවරණය විය.

<u>නිර්දේශ</u>

i. දත්ත ලබාගැනීමේ හා ආරක්ෂා කිරීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
ii. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සඳහා බලපවත්වන 1992 අංක 03 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
iii. ප්‍රාදේශීය කාර්යාල ව්‍යුහය පිළිබඳව අධීක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

**12.** <u>ප්‍රවාහන බලපත්‍ර</u>

කාර්යාංශය විසින් 2022 වර්ෂයේ දී ප්‍රවාහන බලපත්‍ර 956,207 ක් ද , 2023 වර්ෂයේ දී ප්‍රවාහන බලපත්‍ර 378, 285 ක් ද, 2024 වර්ෂයේ දී ප්‍රවාහන බලපත්‍ර 463,996ක් හා 2025 අගෝස්තු 11 වන දින දක්වා ප්‍රවාහන බලපත්‍ර 344, 066 ක් ද නිකුත් කර තිබුණි. 2022 වර්ෂයට සාපේක්ෂව 2025 වසර වන විට ප්‍රවාහන බලපත්‍ර සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වී තිබූ අතර පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 28.1 වගන්තිය ප්‍රකාරව කළුගල් ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබිණි.

ප්‍රවාහන බලපත්‍ර අතුරින් වැඩි ප්‍රමාණයක් ගංගා වැලි සඳහා නිකුත් කර තිබුණි. කොවිඩ් වසංගත සමයේ දී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම සාපේක්ෂව අඩු වී තිබූ අතර ගංගා වැලි සඳහා බලපත්‍ර ලබාදීම නතර කර තිබූ බැවින් 2024, 2025 වර්ෂවල ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම අඩුවීමට හේතු වී තිබිණි.

කළුගල් නිෂ්පාදනය සඳහා යොදාගන්නා පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය මත පදනම්ව නිෂ්පාදනය කරනු ලබන කළුගල් ප්‍රමාණය තීරණය කරයි. ඒ අනුව ප්‍රවාහනය කරන කළුගල් ප්‍රමාණය තීරණය කළ හැකි බැවින්, කළුගල් ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබා නොදෙන අතර කැණීම් බලපත්‍රලාභියාට ප්‍රවාහන බලපත්‍ර ලබාදීම කරනු ලබයි. අනාගතයේදී digital based re-engineering ක්‍රමවේදයක් හරහා කළුගල් මිල ඉහළ නොයන පරිදි කටයුතු කිරීමට කාර්යාංශය බලාපොරොත්තුවේ.

යොදාගනු ලබන පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය මත පදනම්ව නිෂ්පාදිත කළුගල් ප්‍රමාණය හඳුනා ගැනීම තර්කානුකූල ක්‍රමවේදයක් නොවන බව හඳුනාගන්නා ලදී.

දැනට රට තුළ ගල්කොරි 1087ක් පමණ පවතී. රාජ්‍ය භාග, බලපත්‍ර ගාස්තු හා ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු ලෙස කාර්යාංශයට ආදායම් ලැබේ.

කළුගල් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට තීරණය කළහොත් කළුගල්වල වෙළඳපොල මිල ඉහළයාමේ අවදානමක් පවතීනම් ඒ සම්බන්ධයෙන් ද පරීක්ෂා කර තීරණය කළ යුතු බව හඳුනාගෙන ඇත.

<u>**නිර්දේශ**</u>

i. කැණීම් කරනු ලබන කළුගල් ප්‍රමාණය සම්බන්ධයෙන් නිශ්චිත අදහසක් ලබා ගත හැකි ක්‍රමවේදයක් සකස් කිරීම.

ii. රාජ්‍යභාගය නිසි පරිදි කාර්යාංශයට ලැබෙනවාද යන්න පිළිබඳව පරීක්ෂා කර බලා ඒ පිළිබඳව යාවත්කාලීන දත්ත පද්ධතියක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

## 13. <u>මීරිගම කිතලවලාන ගල් කොරිය</u>

ගම්පහ ප්‍රදේශයේ ක්‍රියාත්මක මීරිගම කිතලවලාන ගල් කොරියේ කළුගල් කියුබ් 1ක් සඳහා රු. 240 ක් වැනි ඉතා සුළු මුදලක් රාජ්‍ය භාගය ලෙස රජයට ගෙවා විශාල වශයෙන් ලාභ ලබමින් රජයට හෝ මහජනයාට සාධාරණ ලෙස කටයුතු නොකරන තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය. කළුගල් නිෂ්පාදන ආයතනවලින් නිසි පරිදි රාජ්‍ය භාග අයකර ගැනීම හා අදාළ පරිශ්‍රයන් පරීක්ෂා කිරීම කාර්යාංශය සතු වගකීමකි.

## 14. <u>IML/C/HO/N/17006 දරන කාර්මික කැණීම් බලපත්‍රය ලබා දීම</u>

IML/C/HO/N/17006 දරන කාර්මික කැණීම් බලපත්‍රය;

- හලාවත වැවිලි සමාගමට අයත් පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි මුක්කුතොඩුවාව වතුයායේ වැලි ඉවත් කිරීම සඳහා ගෙෂණි සප්ලයර්ස් (පුද්) සමාගම වෙත මාසික නිෂ්පාදන පරිමාව කියුබ් 500 කට නොවැඩි සහ කැණීම් කළ හැකි මුළු කියුබ් ප්‍රමාණය කියුබ් 9400 නොවැඩි විය යුතු ය යන කොන්දේසි යටතේ කාර්මික කැණීම් බලපත්‍රයක් නිකුත් කර තිබූ අතර මෙම බලපත්‍රය 2023 දෙසැම්බර් 14 දින සිට 2024 සැප්තැම්බර් 13 දක්වා අවස්ථා තුනකදී අලුත් කර තිබුණි.
- ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස්(පුද්) සමාගම විසින් 2024 දෙසැම්බර් මස 19 වන දින නිකුත් කරන ලද කැණීම් කරන ලද වැලි පරිමාව ඇස්තමේන්තු කිරීමේ වාර්තාව ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් වැලි කියුබ් 36,531 සිට 45,561 ක පරාසයක වැලි තොගයක් ඉවත් කර ඇති බව හා කියුබ් 1594 ක් සඳහා පමණක් රාජ්‍ය භාගය ලෙස_රු.686,464 ක් කාර්යාංශය වෙත ගෙවා තිබූ බවත් වාර්තාවේ පහළ පරාසය පමණක්

සැලකිල්ලට ගැනීමේදී කියුබ් 34,937 ක් සඳහා රු.12,725,452 ක රාජ්‍ය භාගය ගෙවා නොතිබුණි.

- වැලි කියුබ් 2920 ක් පමණක් ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර කාර්යාංශය වෙතින් ලබාගෙන තිබියදී වාර්තාවේ පහළ පරාසය සලකා බැලීමේදී කියුබ් 33,611 ක වැලි තොගයක් බලපත්‍ර රහිතව ප්‍රවාහනය කර තිබිණි.
- 2024 සැප්තැම්බර් 13 දක්වා බලපත්‍රය අලුත් කිරීමට අදාළව පැනවූ නව කොන්දේසිය ප්‍රකාරව කාලසීමාව ඉකුත් වන දිනයේදී කැණීම් කරන ලද භූමිය කාර්යාංශය සෑහීමකට පත්වන පරිදි පුනරුත්ථාපනය කළ යුතු බව දක්වා තිබුණද මෙම පුනරුත්ථාපන කටයුතු අවශ්‍ය පරිදි සිදුකර තිබේද යන්න පරීක්ෂා කිරීමට පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය විසින් 2025 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබිණි.

මෙවැනි තත්ත්වයක් තිබියදී ආයතනය සඳහා ලබා දී තිබූ කැණීම් බලපත්‍රය තෙවරක් අලුත් කර තිබුණි.

රාජ්‍ය භාගය අහිමි වීම, ප්‍රවාහන බලපත්‍ර රහිතව කටයුතු පවත්වාගෙන යාම යන කරුණු පිළිබඳව කාර්යාංශය නිසි අවධානය යොමු නොකිරීම හා නියාමනය සිදු නොකිරීම කාර්යාංශයේ වගකීම පැහැරහැරීමක් බව නිරීක්ෂණය විය.

<u>නිර්දේශ</u>

i. ශ්‍රී ලංකාව තුළ පැවති ගල් වලවල් ප්‍රමාණය, ලබා දුන් කැණීම් බලපත්‍ර සංඛ්‍යාව, එමගින් ලද රාජ්‍ය භාගය පිළිබඳ විශේෂ විමර්ශනයක් සිදු කිරීම.

ii. ගල් හා වැලි සම්බන්ධයෙන් ආයතනය විසින් තම පනත අනුව කටයුතු කර තිබේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීම.

iii. කැණීම් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

## 15. කැණීම් භූමි පුනරුත්ථාපනය

පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 52.2 වගන්තිය ප්‍රකාරව කැනීම්වලින් අනතුරුව කැනීම් භූමි පුනරුත්ථාපනය කරවීමට කටයුතු කළ යුතුය. කැනීම් බලපත්‍රලාභීන් 2713 ක් ලවා භූමි පුනරුත්ථාපන කටයුතු සිදුකර ගැනීමට කාර්යාංශය කටයුතු කර නොතිබිණි. එසේම කාර්යාංශය කැණීම් මගින් සිදුවන පරිසර හානිය පිළිබඳව වගකීම් විරහිතව කටයුතු සිදුකර තිබුණි.

කැණීම් භූමි පුනරුත්ථාපනය සම්බන්ධයෙන් කාර්යාංශය විසින් සිදුකරන නියාමනය හා නිරීක්ෂණ කාර්යභාරය නිසි පරිදි ඉටු කළ යුතුය. එසේම කැණීමකදී සිදුවන පරිසර හානිය පිළිබඳව අවධානය යොමු කර සමස්ථ පුනරුත්ථාපන ක්‍රියාවලියම සමාලෝචනය කිරීමේ වගකීම ද කාර්යාංශය සතුවේ.

<u>නිර්දේශ</u>

i. පුනරුත්ථාපන ක්‍රියාවලිය පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදුකර සමස්ථ පුනරුත්ථාපන ක්‍රියාවලිය නැවත සමාලෝචනය කිරීම (නිසි පරිදි පුනරුත්ථාපනය සම්පූර්ණ නොකරන ආයතනවලට කැණීම් බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ ලබා දී ඇති බලපත්‍ර අහෝසි කිරීමට කටයුතු කිරීම වැනි සුදුසු ක්‍රියාමාර්ග ගැනීම).

ii. පුනරුත්ථාපන කටයුතු පැහැරහැරීම සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීම.

iii. කැණීම් මගින් සිදුවන පරිසර හානිය අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

## 16. <u>තිරුවානා හා මිනිරන් අපනයනය</u>

තිරුවානා ඛනිජයක් වශයෙන් කාර්යාංශය යටතට ගැනෙන බව අනාවරණය වූ අතර කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය පහත කරුණු ද කාරක සභාව හමුවේ සඳහන් කළාය.

- තිරුවානාවල අඩංගු මැණික්මය වටිනාකම සහිත කොටස් ද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හරහා අඩු මුදලකට අපනයනය කෙරෙන බැවින් ගැටලු මතු වී තිබීම,
- මැණික්මය වටිනාකම සහිත තිරුවානා කොටස් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හරහා අපනයනය කිරීමටත් මැණික්මය වටිනාකමක් නොමැති තිරුවානා කොටස් (කැට හා කුඩු ලෙස) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හරහා අපනයනය කරන ලෙස දන්වමින් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙතින් තම කාර්යාංශය වෙතට ලිපියකින් දැනුම්දී තිබූ බවත්,
- මැණික්මය ගුණාංග ඇති හා නොමැති තිරුවානා ඇති බවත් තිරුවානාවල මැණික්මය කොටස පළිඟු වන බව හා,
- 1998 වර්ෂයේ දී ලබාගෙන ඇති අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව තිරුවානා අපනයනයේදී අගය එකතු කිරීමක් සිදු කරන ලෙසට තීරණය වී ඇති බව.

තිරුවානා අපනයනය විධිමත් කිරීමේ පරමාර්ථයෙන් 2025.04.17 දිනැතිව කාර්යාංශය විසින් අභ්‍යන්තර චක්‍රලේඛයක් ද නිකුත් කර ඇත.

පළිඟු හා තිරුවානා ස්ඵටික අපනයනය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය යටතට ගනු ලබන බවත්, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් මේ දක්වාම තිරුවානා අපනයනය කිරීම ආරම්භ කර නොමැති බවත් කාරක සභාවට අනාවරණය විය.

වත්මන් තත්ත්වය තුළ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හෝ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යන ආයතන 2න් එක් ආයතනයක්වත් තිරුවානා අපනයනය නොකිරීම තුළ රටට ලැබෙන අපනයන ආදායම අඩුවීම හේතුවෙන් රටට අලාභයක් සිදුවී තිබෙන බව නිරීක්ෂණය විය.

<u>නිර්දේශ</u>

i. තිරුවානා හා මිනිරන් අපනයනය කිරීමේදී කාර්යාංශය විසින් 2025.04.17 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයට අනුව ගත් තීරණය නැවත සමාලෝචනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
ii. පළිඟු අපනයනය නියාමනය කිරීමේ ක්‍රියාවලිය නිසි පරිදි සිදුවේදැයි පරීක්ෂා කිරීම.
iii. පළිඟු අපනයනය ධෛර්යමත් කිරීමට හා තිරුවානා අපනයනය අධෛර්යමත් නොකිරීමට කටයුතු කිරීම.
iv. තිරුවානා අපනයනය ධෛර්යමත් කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් සකස් කිරීම හා අපනයනය මගින් රටට ආදායමක් ලැබෙන බව තහවුරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
v. පළිඟු අපනයනය නියාමනය කිරීම.
vi. තිරුවානාවල වටිනාකම සහිත කොටස වෙන්කර ඉතිරිය විදේශ රටවලින් ඉල්ලුම් කරන ආකාරයට අපනයනය කිරීම සඳහා තනි ක්‍රමවේදයක් සකස් කිරීම.
vii. තිරුවානා අපනයනය අධෛර්යමත් කිරීම නිසාවෙන් රටට අහිමි වූ ආදායම, අහිමි වූ රැකියා, රාජ්‍ය භාගය සහ විදේශ වෙළඳපොල කොටස අහිමිවීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.

## 17. <u>ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් ස්ථාපිත කිරීම</u>

ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) ස්ථාපිත කිරීම සඳහා 2022 වර්ෂයේ රු.1,661,910 ක් වැය කර තිබුණි. 2023 පෙබරවාරි 20 දින මෙය ක්‍රියාත්මක

නොකිරීමට තීරණය කර තිබීමෙන් ඉහත කී වියදම නිෂ්කාර්ය වී තිබුණි. එසේ වුවද කාර්යාංශය විසින් යෝජිත ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) ක්‍රියාත්මක කිරීමේ අරමුණින් රු.20,394,000 කට පරිගණක යන්ත්‍ර 60 ක් 2023 පෙබරවාරි 21 වන දින මිලදී ගෙන තිබූ අතර විගණිත දිනය වූ 2024 මාර්තු 15 වන විට මින් රු.4,078,800 ක් වටිනා පරිගණක යන්ත්‍ර 12 ක් නිෂ්කාර්යව ගබඩාව තුළ රඳවා තබා තිබුණි.
තොරතුරු පද්ධතියේ පවතින දුර්වලතාවයන් කාර්යාංශයේ ගැටලු බොහොමයකට හේතුවී ඇති බව නිරීක්ෂණය විය. දැනට ආයතනයේ කැණීම් අංශය හා මූල්‍ය අංශය ආවරණය වන සේ ‘‘ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය’’ යන නම වෙනුවට Digital based re-engineering solution නම් මෘදුකාංගය ස්ථාපිත කිරීමට ආයතනය සැලසුම් කර ඇති බව ද අනාවරණය විය.

<u>**නිර්දේශ**</u>

i. ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මක කළ හැකි ආකාරය පිළිබඳව ඩිජිටල් ආර්ථික කටයුතු අමාත්‍යතුමා සමග සාකච්ඡා කිරීම.
ii. මේ සම්බන්ධව අතුරු වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

## 18. උපායමාර්ගික සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

### 18.1 උපායමාර්ගික සැලැස්ම

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ඇතුළත් රජය සතු ව්‍යාපාර සඳහා වූ යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයෙහි 2.3 වගන්තිය ප්‍රකාරව රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව උපායමාර්ගික සැලැස්ම 2024-2028 කාලය සඳහා සකස් කර තිබූ නමුත් එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොතිබිණි.

එයට හේතු වී තිබුණේ, 2024-2028 වර්ෂයන් සඳහා සකස් කරන ලද සංයුක්ත සැලැස්ම 2024 ජූනි මාසයේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ ද එහි තාක්ෂණික වචනයන්හි දෝෂ කීපයක් තිබීම හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොතිබීමයි. 2019-2023 කාල සීමාව සඳහා සකස් කර තිබූ උපායමාර්ගික සැලැස්ම ද, බාහිර ආයතනයක් විසින් සකස් කර තිබුණි. එසේම ආයතනය තුළ සැලසුම් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරියෙකු නොමැති බව ද නිරීක්ෂණය විය.

ඒ අනුව මෙම කාර්යාංශය ඉලක්කයක් නොමැති ආයතනයක් බව පිළිබිඹු වේ.

**<u>නිර්දේශය</u>**

i. රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව කාර්යාංශය සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කර කාරක සභාවට ඉදිරිපත් කිරීම.

## 18.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම, 2025 ජනවාරි 15 දින කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. නමුත් ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කාර්යයන්, සංඛ්‍යාත්මකව දක්වා නොතිබූ අතර ඒ හේතුවෙන් ප්‍රගතිය ඇගයීමට ද නොහැකි වී තිබුණි. සාමාන්‍යයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, උපායමාර්ගික සැලැස්මේ කොටසක් ලෙස ඇතුළත් විය යුතු වුවත්, උපායමාර්ගික සැලැස්මක් නොමැතිව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණි. ප්‍රසම්පාදන සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්මේ දිගුවක් ලෙස සකස් විය යුතු බව ද අවධාරණය කෙරිණි.

**<u>නිර්දේශය</u>**

i. ප්‍රගතිය ඇගයීමට හැකිවන පරිදි 2026 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර, විගණකාධිපතිට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

## 19. <u>අධ්‍යක්ෂ (මානව සම්පත්) අනිවාර්ය නිවාඩු යැවීම</u>

2023 දෙසැම්බර් 21 දින සිට අනිවාර්ය නිවාඩු යවා තිබුණු අධ්‍යක්ෂ (මානව සම්පත්) සම්බන්ධයෙන් මූලික විමර්ශනය 2024 සැප්තැම්බර් 10 පවත්වා තිබුණි. නිලධාරියාට විරුද්ධව චෝදනා නැගීමට තරම් ප්‍රමාණවත් හේතු සාධක ඇති බව මූලික විමර්ශනය මගින් බැලූ බැල්මට පෙනී යන්නේ නම්, අදාළ විනය බලධරයා විසින්, නිලධාරියා වෙත චෝදනා පත්‍රයක් නිකුත් කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණ අතර විධිමත් විනය පරීක්ෂණය ද පවත්වා නොතිබුණි. එබැවින් වසර 1 ½ ට වැඩි කාලයක් සඳහා සේවයක් ලබා නොගෙන අදාළ නිලධාරියාට වැටුප් ගෙවමින් පැවතුන අතර 2025 අගෝස්තු දක්වා රු. 1,895,160 ක මුදලක් ගෙවා තිබුණි.

අදාළ නිලධාරියා අනිවාර්ය නිවාඩු යවා, අමාත්‍යාංශය විසින් මූලික විමර්ශනයක් සිදු කර තිබුණි. මෙම නිලධාරියාගේ බඳවා ගැනීමේ සුදුසුකම් නැවත පරීක්ෂා කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඒ සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හා පරිසර අමාත්‍යාංශය යන ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබුණි. එම කමිටු වාර්තාව 2025.08.27 දින කාර්යාංශයට ද ලැබී තිබුණි.

පරිවාස කාලය තුළ සිටින නිලධාරියෙක් සම්බන්ධයෙන් වන විනය කටයුත්තකදී අනිවාර්ය නිවාඩු යැවීම වෙනුවට ඔහුගේ සේවය අවසන් කළ හැකිව තිබුණි. ඒ අනුව කාර්යාංශය ගෙන තිබූ තීරණය ගැටලුකාරී විය.

**<u>නිර්දේශය</u>**

**i.** මේ සම්බන්ධයෙන් සිදුකර ඇති මූලික විමර්ශනය විධිමත් ලෙස නැවත සිදු කිරීම හා ඒ සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.